කෑගල්ල නගර සභාව

කෑගල්ල දිස්ත්‍රික්කය.

..................................

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 30 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 26 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 ජූලි 02 සභාවේ සභාපතිවරයාට යවා ඇත.

### 1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට කෑගල්ල නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.

-----------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාවට අයත් ප්‍රසිද්ධ සුසාන භූමියේ ඉඩම , තානායම සමඟ ඉඩම,ෆැන්සිස් මොලමුරේ මාවත ඉඩමේ හා හර්බට් ජේ සෙනෙවිරත්න මාවත පිහිටි නිල නිවාසයේ වටිනාකම ආදිය ගණනය කර ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් ඉඩම් හා ගොඩනැගිලි සත්‍ය වටිනාකම ගිණුම් මගින් හෙලිදරව් වී නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන ලද පිටිහුමවත්ත ඉඩමෙන් ලද 10% ක බිම් ප්‍රමාණය වූ පර්චස් 67.5 ක ඉඩමේ වටිනාකම වූ රු.15,153,307 ක මුදල ඉඩම් හා ගොඩනැගිලි වටිනාකමට ඇතුළත් නොවීම හේතුවෙන් ස්ථාවර වත්කම් වල වටිනාකම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) පුනරාවර්තන වැය යටතේ ගිණුම්ගත කල යුතුව තිබූ වැටුප්, අතිකාල හා නිවාඩු දින වැටුප් වශයෙන් සමාලෝචිත වර්ෂය තුල වැය කල රු.1,501,701 ක් දෝෂසහගතව ප්‍රාග්ධන වැය යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ උපකරණ වැය එකතුවරු.57,515,512 ක් වුවත් එය රු.57,870,296 ක් ලෙස ගිණුම්ගත කිරීමෙන් රු.354,784 ක මුදලක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ මුද්දර ගාස්තු ආදායම ගණනය කිරීමේදී 2013 ජනවාරි මස සිට 2014 මාර්තු මාසය දක්වා වූ කාලය තුළ ලැබී තිබූ රු. 5,246,396 ක මුදල උපචිත පදනමින් බැහැරව ගිණුම්ගත කර තිබූ අතර, 2014 වර්ෂයට අදාල හිඟ ආදායම් ගිණුම් ගත කර නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය තුල වරෙන්තු ගාස්තු වශයෙන් ලද රු.533,550 ක් වු මුළු මුදලම උපචිත පදනමින් බැහැරව අදායම් ලෙස ගිණුම් ගත කර තිබුණි.

(උ) ලැබිය යුතු මන්ත්‍රී දීමනා ප්‍රතිපූර්ණ ආදායම රු.180,000 ක් වුවත්, එය රු.155,000 ක් ලෙස රු.25,000 ක් අඩුවෙන් දැක්වීම නිසා ආදායම් ණයගැතියන් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂය තුළදී ඉඩම් විකිණීම් වලට අදාලව කට්ටි සැළැස්ම අනුමත කිරීමට පෙරාතුව බිම් කොටස් වල විකුණුම් වටිනාකම පිළිබඳව තාවකාලික තක්සේරුව මත ලබාගත් 1% ක් වූ රු.1,784,746 ක තැන්පත් මුදල ,සාවද්‍යාව වර්ෂයේ ආදායමක් ලෙසට ගිණුම්ගත කිරීම නිසා වර්ෂයේ ආදායම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

1.3.2 නොසැසඳූ පාලන ගිණුම්.
-----------------------------
පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ගිණුම් විෂයයන් 03 කට අදාලව මුල්‍ය ප්‍රකාශනවල සඳහන්ශේෂයන්ගේ එකතුව රු.7,820,229ක් වූ අතර, උපයෝගී ලේඛන / වාර්තා අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.6,873,190 ක් වූයෙන් වෙනස රු.947,039 ක් විය .

(ආ) මුල්‍ය ප්‍රකාශන අනුව රු.16,392,330 ක් ලෙස දැක්වෙන පොදු තැන්පත් ගිණුම වසර ගණනාවක සිටම තුලනය කර නොතිබුණි. මේ නිසා පොදු තැන්පත් ලේඛනය සමඟ ගිණුමේ ශේෂය සැසඳිය නොහැකි විය.

1.3.3 අවිනිශ්චිත ගිණුම
-----------------------

2014 දෙසැම්බර් 31 දිනට නිරවුල් නොකරන ලද අවිනිශ්චිත ගිණුම් වල බැර ශේෂවල එකතුව රු.5,992 ක් විය.

1.3.4 ලැබිය යුතු ගිණුම් හා ගෙවිය යුතු ගිණුම්.
--------------------------------------------

2014 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම් ශේෂයන්හි එකතුව පිළිවෙලින් රු.3,781,875 ක් හා රු.44,682,834 ක් විය.

1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

----------------------------------

ගිණුම් විෂයයන් 02 කට අදාලව අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.13,447,846ක් වූ ගනු දෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.6 නීති රීති රෙගුලාසි වලට අනුකූල නොවීම.
--------------------------------------------

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| 2005 ජුනි 01 දිනැති සබරගමුව පළාත් පාලන කොමසාරිස්ගේ අංක 2005/4 දරන චක්‍රලේඛය | |
| iv වගන්තිය | ඉඩම් විකිණීමට අදාලඉඩම් දෙකකින් 1%ක තැන්පත් ලෙස රු. 1,784,746 ක මුදලක් ලබාගෙන තිබුණද, ඉඩම් කොටස් විකිණීමෙන් පසු විකුණූ වටිනාකමට අදාල 1% ක බදු මුදල ගෙවන බවට කොන්දේසි ඇතුලත් ගිවිසුම් වලට එළඹ නොතිබුණි. |
| Viii වගන්තිය | ඉඩම් විකිණීම පිළිබද ලේඛනය පවත්වා නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල.

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.38,556,845 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.49,050,076 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.10,493,231 ක පිරිහීමක් දක්නට ලැබුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ ආදායම් විෂයයන් 4 ක අඩුවීම හා වියදම් විෂයයන් 3 ක වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලය රු. 10,493,231 කින් පිරිහීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

2.3 ආදායම් පරිපාලනය

-----------------------

2.3.1 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

---------------------------------------

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම , තථ්‍ය ආදායම හා හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | | | | | 2014.12.31 දිනට හිගය | |
|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | 2014.01.01 දිනට හිගය | 2014.12.31 දිනට හිගයෙන් අයකිරීම | 2014 වර්ෂයේ බිල් කිරීම් | වර්ෂයේ බිල් කිරීම්වලින් අයවීම | 2014.01.01 දිනට පැවති හිගයෙන් අයවීම | වර්ෂයේ බිල් කිරීම් වලින් හිගය | මුළු හිගය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| iවරිපනම් හා බදු | 4,985 | 1,965 | 9,355 | 6,582 | 3,020 | 2,733 | 5,753 |
| ii බදු කුලී | 5,343 | 5,462 | 28,342 | 27,436 | (120) | 905 | 785 |
| iiබලපත්‍ර ගාස්තු | 267 | 267 | 2,609 | 2,887 | - | (278) | (278) |
| Ivවෙනත් ආදායම් | 17,221 | 16,690 | 14,018 | 13,347 | 525 | 671 | 1,196 |

උක්ත තොරතුරු 2014 දෙසැම්බර් 31 දිනට මුල්‍ය ප්‍රකාශන වල ශේෂය සමඟ සැසඳීමේදී පහත පරිදි නිරීක්ෂණය විය.

| | හිඟ ආදායම් වාර්තාව අනුව ශේෂය | මුල්‍ය ප්‍රකාශන අනුව ශේෂය | වෙනස |
|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 |
| හිඟහිටි වරිපනම් | 5,753 | 5,002 | 751 |
| හිඟහිටි වෙනත් ආදායම් | 1,703 | 39,358 | 37,655 |

2.3.2 වරිපනම් බදු

----------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 2014 දෙසැම්බර් 31 දිනට රු.5,002,800 ක් වූ වරිපනම් බදු හිඟ ශේෂය අතුරින් වැඩි බදුකරුවන් පිරිසක් දීර්ඝ කාලයක සිට ගෙවීම් පැහැර හැර තිබුණද, නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 170 (1) වගන්තිය ප්‍රකාරව කටයුතු කර හිඟ බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) වර්ෂ 2002 න් පසුව වරිපනම් බද්දට අයත් දේපල රජයේ තක්සේරුකරු ලවා තක්සේරු කර නොතිබුණි.

(ඇ) වරිපනම් බද්දට අදාල දේපල හිමිකරුවන් 77 ක් හඳුනාගෙන නොතිබුණි.

(ඇ) සභාව නමින් පවතින දේපල සඳහාද පුද්ගල නම් ඇතුළත් කරමින් වරිපනම් බදු අයකර තිබුණු අතර, සභාවට අයත් දේපල හඳුනාගෙන පවරා ගැනීමට පියවර ගෙන නොතිබුණි.

2.3.3 බදුකුලී

---------

නව ආර්ථික මධ්‍යස්ථානයේ විවෘත වෙළඳපල කඩකාමර 52 ක බදු කුලී නිසි පරිදි නොගෙවීමේ හේතුවෙන් 2010 වසරේදී සභාවට පවරා ගන්නා අවස්ථාව වන විට රු.1,529,853 ක හිඟයක් පැවති අතර, බදුකරුවන් සමඟ ගිවිසුම් වලට නොඑළඹීමේ හේතුවෙන් හිඟ බදු මුදල් අයකර ගැනීමට නොහැකිව තිබුණි.

2.3.4 බලපත්‍ර ගාස්තු

-----------------

සභා බල ප්‍රදේශය තුළ බලපත්‍ර ලබා නොගෙන ව්‍යාපාර පවත්වාගෙන යාමට ඉඩ සැළසීමෙන් 2014 වර්ෂයේදී සභා අරමුදලට රු.48,000 ක බදු මුදලක් අහිමිව තිබුණි.

2.3.5 වැසිකිළි පද්ධතියේ බදු ආදායම

-----------------------------------

2013 සහ 2014 වර්ෂයන් දෙකේදී බදුකරුවන් 4 දෙනෙකුගෙන් රු.109,977 ක බදු මුදලක් සහ රු.112,645 ක හිඟ ජල බිල්පත් ගාස්තුවක්ද එකතුව වශයෙන් රු. 222,622 ක් අයවීමට තිබුණි.

2.3.6 විනෝද බදු

--------------

සමාලෝචිත වර්ෂය තුළදී සිනමාශාලා නොවන විනෝද බදු රු.122,875 ක් අයකරගෙන තිබුණද ඒ සඳහා නීතිමය බලතල සපුරාගෙන නොතිබුණි.

2.3.7 ව්‍යාපාර බදු

--------------

2013 හා 2014 වර්ෂ වලදී ගිවිසුම් වලට එළඹ තිබුණද ගිවිසුම් ප්‍රකාරව කටයුතු නොකිරීමෙන් ව්‍යාපාර බදු වශයෙන් ලබාගත යුතුව තිබුණු රු.55,000 ක බදු මුදලක් ද හිග මාසික බදු මුදල් ලෙස

රු. 37,024 ක් ද, ආරක්ෂිත ඇප තැන්පත් ලබා නොගැනීමෙන් ගිවිසුම් කඩ කිරීමේ හේතුව මත සභාව සතු කළ යුතු ව තිබුණු රු.34,200 ක මුදලක් ද වශයෙන් රු.126,224 ක් සභාවට පාඩුවී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සබරගමුව පළාත් ප්‍රධාන අමාත්‍යාංශයෙන් ලැබුණු රු. 18,005,000 ක් වටිනා වාහන 13 ක අයිතිය සභාව නමින් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2010 වර්ෂයේ සිට 2014 ජනවාරි දක්වා කර්මාන්ත 03 ක් සඳහා ගෙවන ලද රු.83,410 ක අත්තිකාරම් මුදල් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තා මඟින් වර්ෂ කීපයකදීම පෙන්වා දී තිබූ බැහැර ගෙනගිය පොත් 46 ක් ආපසු ලබා ගැනීම හෝ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) වැටුප් රහිත නිවාඩු සඳහා වැටුපෙන් අයකිරීමේදී මූලික වැටුප පදනම් කර ගැනීම හේතුවෙන් 2013 හා 2014 වර්ෂ දෙකේදී පමණක් රු.505,842 ක මුදලක් සභා අරමුදලට පාඩු සිදුව තිබුණි.

3.2 වත්කම් කළමනාකරණය

නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්.

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) වටිනාකමරු.397,500 ක් වූ ස්ථාවර වත්කම් විෂයයන් 04 ක් නිශ්ක්‍රීයව පැවතුණි.

(ආ) රු.73,640 ක් වටිනා පීවීසී අභල් 1 ½ බට මීටර් 516 ක් වර්ෂයකට අධික කාලයක්ද, රු.58,776 ක් වටිනා පීවීසී අභල් 2 බට මීටර් 248 ක් 2010 ජනවාරි මස සිටද, රු.256,650 ක් වටිනා තාර බැරල් 14.73 ක් 2013 ජූනි 04 දින සිටද නිකුත් නොවන ගබඩා තොග ලෙස පැවතුණි.

3.3 කොන්ත්‍රාත් පරිපාලනය

------------------------------

2014 වර්ෂයේ පළාත් පාලන උපමාන පාදක අරමුදල් යටතේ නන්දිවල වත්ත ක්‍රීඩා පිටිය සංවර්ධනය සඳහා රු.300,000 ක ප්‍රතිපාදන ලැබී තිබුණද අදාල කර්මාන්තය 2015 පෙබරවාරි වන විටත් ඉටුකර නොතිබුණි.

4. පද්ධති හා පාලන.

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය

(ඇ) තොග පාලනය

(ඉ) ණයගැති පාලනය